මාධ්‍ය මගින් භාවිතා කරනා භාෂාව සම්බන්ධයෙන් අප සැමවිටම සැලකිලිමත් වන්නේ, එම භාෂාව ඔස්සේ සමාජයේ ආකල්ප සහ සිතුම් පැතුම් හැඩගැසීමට තිබෙනා හැකියාව නිසාම වේ. වඩාත් ශිෂ්ට සම්පන්න නැතිනම් කිසිවෙකු කොන් නොකෙරෙන භාෂාවක් භාවිතය ඔස්සේ, සමාජ චින්තනයද ශිෂ්ට සම්පන්න ලෙසින් හැඩ ගැසෙනු ඇත.

දූෂණය, කෙලෙසීම වැනි යෙදුම් ලිංගික අපරාධයන්/ලිංගික අපයෝජනයන් සඳහා භාවිතා වීම නිදසුනක් ලෙස ගත හැක. මෙහි ගැටළුව වන්නේ, දූෂණය හෝ කෙලෙසීම වැනි යෙදුම් ඔස්සේ ගම්‍ය වන්නේ අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීමයි. මේ ඔස්සේ ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක්වූ වින්දිතයින් කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ නිර්මාණය වේ. එනිසා, දූෂණය හෝ කෙලෙසීම වැනි යෙදුම් වෙනුවට යෝග්‍ය වන්නේ ලිංගික අපරාධය/අපයෝජනය වේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Aruna #Lankadeepa**